# රැකියා ඇබෑර්තු

## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත)

## පහත තනතුරු සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) - තනතුරු 01 (ස්ථිර)**

**පුද්ගලික සහකාර - තනතුරු 01 (කොන්ත්‍රාත්)**

**රියදුරු - තනතුරු 02 (ස්ථිර)**

**තනතුර** : **සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) සිවිල් - ස්ථිර පදනම - තනතුරු 01**

**වැටුප් පරිමාණය** : 91,690-10X2,480-15X 3,450-168,240 MM 1-1

**අධ්‍යාපන සුදුසුකම්** : පිළිගත් විශ්වවිද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව (සිවිල්) පිළිබඳ උපාධියක් සමග වසර 02 ක අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**තනතුර,** : **පුද්ගලික සහකාර- කොන්ත්‍රාත් පදනම - තනතුරු 01**

**වැටුප් පරිමාණය** : 50,540-10X540-7X630-4X1,080-20X1,280-90,270

**අධ්‍යාපන සුදුසුකම්**

**බාහිර බඳවා ගැනීම්** : වරලත් ලේකම්වරුන්ගේ ආයතනයේ ඩිප්ලෝමාව සමග අවුරුදු 02 ක පළපුරුද්ද,

**අභ්‍යන්තර බඳවා ගැනීම්** : අ.පො.ස.(සා.පෙ.) ගණිතය/සිංහල සහ ඉංග්‍රීසි ඇතුළු විෂයයන් 04 කට සම්මාන සාමාර්ථ සමග විෂයන් 06 ක් සහ අ.පො.ස. (උ.පෙ) විෂයන් 03 ක් සහ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ කළමනාකරණ සහකාර තනතුරේ අවුරුදු 06 ක පළපුරුද්ද.

**තනතුර** : **රියදුරු - ස්ථිර පදනම - තනතුරු 02**

**වැටුප් පරිමාණ** : 43,880-10X490-10X540-10X590-12X630-67,040

**අධ්‍යාපන සුදුසුකම්** **බාහිර බඳවා ගැනීම්**

අ.පො.ස.(සා.පෙ.) විෂයන් 06 ක් එකවර සමත්වීම සහ මනා යාන්ත්‍රික දැනුම, වලංගු රියදුරු බලපත්‍රය (මගීන් 32 කට නොඅඩු) රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය, පළාත් අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වසර 06 ක පළපුරුද්ද හා මහා ඇස් පෙනීම.

**වයස් සීමාව -**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි වියයුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ට බල නොපැවැත්වේ.

**වෙනත් කරුණු :-**

1. බඳවා ගනු ලබන අයදුම්කරුවන්ගේ මූලික වැටුපෙන් 10% ක් සේවක අර්ථ, සාධක අරමුදල සඳහා ඔවුන් විසින් ගෙවිය යුතු අතර, 15% ක් සේවක අර්ථසාධක අරමුදල සඳහාද, 3% ක් සේවා නියුක්ත භාර අරමුදල සඳහා ද අධිකාරය විසින් දරනු ලබයි.
2. බඳවා ගන්නා අයදුම්කරුවන් ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මූල්‍ය රෙගුලාසි, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, ශ්‍රී ලංකා රජය විසින් හෝ බස්නාහිර පළාත් සභාව විසින් පනවා ඇති හෝ විටින් විට පනවනු ලබන නියෝග හා රෙගුලාසිවලට අවනත විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියේ සභාපති විසින් කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත්, නිසි පරිදි සම්පූර්ණ නොකළ අයදුම්පත් හා ප්‍රමා ද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර, අයදුම්පත ලැබුණු බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ. (බස්නාහිර පළාතේ පදිංචි අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ)

**ඉල්ලුම් කළයුතු පිළිවෙළ :** සිය විස්තර ඇතුළත් කරමින් ඔබ විසින් සකස් කරන ලද අයදුම්පත්‍රය සුදුසුකම් වල පිටපත් සහිතව 2026.04.06 දින හෝ ඊට පෙර, සභාපති, අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බ.ප.), තුම්බෝවිල, කරදියාන, පිළියන්දල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ **wmawp.gov@gmail.com** යන විද්‍යුත් තැපැල් ලිපිනයෙන් යොමු කරන්න. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ඉල්ලුම්පත් තම සේවා ප්‍රධානියා මගින් එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගීවීම වෙනුවෙන් කිසිදු දීමනාවක් ගෙවීමට කටයුතු කරනු නොලැබේ. තවද කිසිදු අයුරකින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට බලපෑම් කිරීම එම තනතුර ලැබීමට නුසුදුසු කමක් සේ සලකනු ලැබේ.


**සභාපති,**
**අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය, බස්නාහිර පළාත.**
**2026.03.19**

**දු.ක - 011-3056703**
**011-2613151**